# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 39 වැනි කාණ්ඩය | සැප්තැම්බර් 2023

## පාර්ලිමේන්තුවේ නව නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න මහතා සිය ධුරයේ රාජකාරී අරඹයි



සන්නිවේදන දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## පුවත්

- පාර්ලිමේන්තුවේ නව නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න මහතා සිය ධුරයේ රාජකාරී අරඹයි
- කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සහ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක මාර්ක් අන්ඩ්‍රේ ෆ්‍රැන්චෙ (Marc-André Franche) මහතා අතර හමුවක්
- ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව තරුණ නායකයන් දැනුවත්කෙරේ
- නීතිඥ සංගමයේ සභාපතිවරයා ඇතුළු සාමාජික පිරිසක් කථානායකවරයා හමුවෙති
- එක්සත් රාජධානියේ මහ කොමසාරිස් ඇන්ඩෘ පැට්‍රික් මහතා සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක්
- කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ දරුවන් 700ක් පාර්ලිමේන්තුවට
- මහජන අවකාශය තුළ පාර්ලිමේන්තුවේ භූමිකාව පිළිබඳ විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කෙරේ
- කොරියානු රැකියා හා කම්කරු අමාත්‍යවරයා සහ කථානායකවරයා අතර හමුවක්
- කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සහ බංගලාදේශ කථානායක (ආචාර්ය) ශිරින් ෂර්මින් චෞද්රි මහත්මිය අතර හමුවක්
- "ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන"සාර්ථකව නිම කළ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට සහතිකපත් සහ තිළිණ ප්‍රදානය කෙරේ
- බදුල්ල දිස්ත්‍රික්කයේ දමිල මාධ්‍ය පාසැල් 26ක ශිෂ්‍ය පාර්ලිමේන්තු සහභාගීත්වයෙන් "පාර්ලිමේන්තු විදු පියස" සිසුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩමුළුවක් බණ්ඩාරවෙලදී



## කාරක සභා පුවත්

- මෙරට පාසල් දරුවන්ගේ ප්‍රජනක සෞඛ්‍ය සහ ලිංගික අධ්‍යාපනය මෙන්ම දරුවන්ට එරෙහි සයිබර් ප්‍රචණ්ඩත්වය පිළිබඳව ළමුන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ අවධානය.
- සිවිල් ආරක්ෂක බලකාය නවීකරණය කිරීම මගින් රටට වැඩදායී සේවයක් ලබාගැනීමට කටයුතු කරනවා - රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්
- පෞද්ගලික වාහන හැර අනෙකුත් වාහන ආනයන සීමා 2023 වසර අවසන් වන විට ඉවත් කරනවා - මුදල් අමාත්‍යාංශය රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවට පවසයි
- මත් ද්‍රව්‍ය විනාශ කිරීමේ මධ්‍යස්ථානයක් සකස් කිරීමේ වර්තමාන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී සාකච්ඡා වේ.

● මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් ආරක්ෂිත බදු මුද්‍රාව (ස්ටිකරය)ව්‍යාජ ලෙස භාවිතා කිරීමට එරෙහිව නිර්දේශ ලබා දුන්නේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවයි - කමිටු සභාපති පාඨලී චම්පික රණවක මහතා

● දරුවන් සහ කාන්තාවන් සිගමනට යොදා ගැනීම නතර කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් - අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කෙරේ

● ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩලස් අලහප්පෙරුම මහතා පත්වෙයි.

● ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන දුර්වලතා සහ අක්‍රමිකතා රැසක් කෝප් කමිටුවේදී හෙළි වෙයි

● බ්‍රික්ස් රටවල් සමග කටයුතු කිරීම ලංකාවට ආර්ථිකමය ලෙස වැදගත් - ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පවසති

● ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සූදානමකින් තොරව කමිටුවට පැමිණීම පිළිබඳව කෝපා කමිටුවේ දැඩි අප්‍රසාදය

● කාන්තාවන් සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය සහ ජනාධිපතිවරයා අතර විශේෂ සාකච්ඡාවක්

● රාජ්‍ය ආයතනවලින් නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමට නොහැකි වීම නිවැරදි පුවත් ජනතාවට සමීප කිරීමට ප්‍රධාන බාධාවක් - ජනමාධ්‍ය ප්‍රධානීහු විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට පවසයි

● ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ නම සංශෝධනය කිරීමට කාරක සභාවේ අනුමතිය..



# පාර්ලිමේන්තුවේ නව නියෝජ්‍ය මහලේකම් චමින්ද කුලරත්න මහතා සිය ධුරයේ රාජකාරී අරඹයි




පාර්ලිමේන්තුවේ නව කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් ධුරයට පත් ජ්‍යෙෂ්ඨ නීතීඥ ජී.කේ.ජ්. චමින්ද කුමාර කුලරත්න මහතා සිය ධුරයේ රාජකාරි ආරම්භ කිරීම පසුගියදා සිදුවිය. පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ඉදිරියේ සිය නිල ප්‍රතිඥාව ලබා දීමෙන් අනතුරුව කුලරත්න මහතා සිය ධුරයේ කටයුතු ආරම්භ කළේය.

මේ මස 19 වැනිදා  පෙරවරු 9.30ට පාර්ලිමේන්තු රැස්වීම ආරම්භ කරමින් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේ නව කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් ධුරයට ජ්‍යෙෂ්ඨ නීතීඥ ජී.කේ.ජ්. චමින්ද කුමාර කුලරත්න මහතා 2023 සැප්තැම්බර් 15 වැනි දින සිට පත් කර ඇති බව නිල වශයෙන් පාර්ලිමේන්තුවට නිවේදනය කළේය.

චමින්ද කුලරත්න මහතා රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන අතර විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරියෙකු වේ. තවද ඒ මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ හා එක්සත් රාජධානියේ බකින්හැම්ෂයර් විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු ද වේ. එමෙන්ම ඒ මහතා 2005 වසරේ සිට ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ යාවජීව සාමාජිකයෙකු මෙන්ම 2016 වසරේ සිට නීතීඥ සංගමයේ කවුන්සිලයේ (Bar Council) සාමාජිකයෙකු ද වේ.

ජ්‍යෙෂ්ඨ නීතීඥ චමින්ද කුලරත්න මහතා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්, ජනාධිපති අතිරේක ලේකම්, අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්, විපක්ෂ නායක අතිරේක ලේකම්, එක්සත් රාජධානියේ ලන්ඩන්හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය උපදේශක, ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ජනාධිපති සහකාර ලේකම් ඇතුලු රජයේ විධායක මට්ටමේ පරිපාලන තනතුරු රැසක් වසර 20ක පමණ කාලයක් පුරා හොබවා තිබේ. ඒ මහතා ව්‍යවස්ථාපිත නීතිය, පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියාදාමයන් පිළිබඳව ද, රාජ්‍ය පරිපාලනය හා මුදල් රෙගුලාසි පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් සහිත ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකි.



කුලරත්න මහතා එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, චීනය, ඉන්දුනීසියාව, ජපානය ඇතුලු රටවල් රැසක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා රැසකට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වී ඇත.

ලංකා බැංකුව, මර්චන්ට් බැංකුව, MBSL ඉන්ෂුවරන්ස් ලිමිටඩ්, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය (GOH), සී/ස මගනැගුම ඉමල්ෂන් පුද්ගලික සමාගම, Colombo Financial City Foundering Ltd. ඇතුලු රාජ්‍ය ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩලයන්හි සාමාජිකයෙකු ලෙස ද ඒ මහතා කටයුතු කර තිබේ.

තවද, කුලරත්න මහතා එක්සත් රාජධානියේ ලන්ඩන්හි ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය උපදේශකවරයෙකු වශයෙන් සේවය කරන ලද කාලවකවානුවේදී තානාපති නිලධාරීන්ගේ පැරණිතම සංගමය වන කන්සියුලර් නිලධාරීන්ගේ සංගමයේ විධායක සභාව නියෝජනය කළ පළමු දකුණු ආසියානු රාජතාන්ත්‍රිකයා ද වේ.

නීතීඥ යෝග්‍යා කුලරත්න මහත්මිය සමග විවාහ වී සිටින චමින්ද කුලරත්න මහතා පුතුන් දෙදෙනෙකුගේ සහ දියණියකගේ ආදරණීය පියෙකි.







# කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සහ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක මාර්ක් අන්ඩ්‍රේ ෆ්‍රැන්චෙ (Marc-Andre Franche) මහතා අතර හමුවක්




කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සහ අභිනවයෙන් පත්වූ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක මාර්ක් අන්ඩ්‍රේ ෆ්‍රැන්චෙ (Marc-André Franche) මහතා අතර හමුවක් මේ මස පළමුවැනිදා (01) පාර්ලිමේන්තුවේ දී පැවැත්විණි. මෙම හමුවට පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ද එක්ව සිටියාය.

ශ්‍රී ලංකාවේ දූෂණ විරෝධී පනත සම්මත කරගැනීම සහ පාර්ලිමේන්තුවේ අයවැය කාර්යාලය පිහිටුවීමට සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක මාර්ක් අන්ඩ්‍රේ ෆ්‍රැන්චෙ මහතා සුබපැතුම් පිරිනැමුවේය. එසේම, මෙම කටයුතු ඉදිරියට සිදු කිරීම සඳහා ඉදිරි වසර 5 සඳහා වන නව සහයෝගීතා වැඩසටහන හරහා ඩොලර් මිලියන 300ක් ලබාදීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය සූදානම් බවද ඔහු සඳහන් කළේය.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සංවර්ධන හවුල්කරුවෙකු ලෙස නිරතුරුව ලබාදෙන සහයෝගය පිළිබඳව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සිය කෘතඥතාව පළ කළේය.

තවද, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, මැතිවරණ ක්‍රමය, සාමය ගොඩනැගීමේ කටයුතු සහ දේශපාලනයේ කාන්තා නියෝජනය යන කරුණු පිළිබඳව ද අදහස් හුවමාරු කරන ලදී.

දේශපාලනය තුළ කාන්තා නියෝජනය තහවුරු කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ගෙන යන වැඩපිළිවෙළ සහ ආංශික අධීක්ෂණ කාරක සභා සඳහා තරුණ නියෝජිතයන් ඇතුළත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය මෙහිදී කරුණු පැහැදිලි කළාය.



# ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව තරුණ නායකයන් දැනුවත් කෙරේ

ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව තරුණ නායකයන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මේ මස පාර්ලිමේන්තු පරිශ්‍රයේදී සංවිධානය කොට තිබිණි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සමඟ එක්ව පැෆරල් ආයතනය විසින් මෙම වැඩමුළු සඳහා තරුණ නායකයන් තෝරා ගෙන තිබිණි. සිංහල හා දෙමළ භාෂා මාධ්‍ය ද්වයෙන්ම පැවති මෙම වැඩමුළු සඳහා ප්‍රධාන සම්පත් දායකත්වය සැපයූවේ , පාර්ලිමේන්තු මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය විසිනි.






වැඩසටහන අරඹමින් අදහස් පළකළ පාර්ලිමේන්තු මහලේකම්වරිය සඳහන් කළේ ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව දැනුම ලබාගැනීම සඳහා දිවයිනේ ප්‍රදේශ රැසක් නියෝජනය කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පැමිණි සියයකට වඩා අධික තරුණ නායකයින්ගේ උනන්දුව අගය කරන බවයි. පාර්ලිමේන්තුවේ කාර්යභාරය වැඩිදුරටත් පැහැදිලි කරමින් ඇය පවසා සිටියේ, පාර්ලිමේන්තුව පිළිබඳ නිවැරදි තොරතුරු බිම් මට්ටමට ගෙන යාමෙහි ලා තරුණ ප්‍රජාවට විශේෂ වගකීමක් පැවරෙන බවයි. පාර්ලිමේන්තු සහකාර මහලේකම් හංස අබේරත්න, අධ්‍යක්ෂ -ව්‍යවස්ථාදායක සේවා ජනකාන්ත සිල්වා යන මහත්වරුන් සහ පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ පරිපාලන ජී. තච්චනරාණි මෙනෙවිය විසින් පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳ තරුණ - තරුණියන් දැනුවත් කරන ලදී.



තරුණ ප්‍රජාව සඳහා කෙරුණු මෙම දැනුවත් කිරීමේ වැඩමුළුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය විසින් පැෆරල් ආයතනය සමඟ එක්ව අඛණ්ඩව පවත්වාගෙන යන සුවිශේෂී දැනුවත් කිරීම් වැඩසටහන් මාලාවක තවත් එක් පියවරක් වශයෙන් සංවිධානය කෙරිණි.

# නීතිඥ සංගමයේ සභාපතිවරයා ඇතුළු සාමාජික පිරිසක් කථානායකවරයා හමුවෙති



නීතිඥ සංගමයේ සභාපති නීතිඥ කෞශල්‍ය නවරත්න මහතා ඇතුළු සාමාජික පිරිසක් සහ කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක් මේ මස 11 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.

පසුගිය කාලය තුළ ඇතැම් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් පාර්ලිමේන්තුව තුළදී සහ ඉන් පිටතදී අධිකරණය, අධිකරණයේ පවතින නඩු සහ විනිසුරුවරුන් සම්බන්ධයෙන් ප්‍රකාශ නිකුත් කිරීම මගින් නීතියේ ආධිපත්‍යයට සහ අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑමක් සිදුවන බවට නීතිඥ සංගමය විසින් හඳුනාගෙන ඇති බව නවරත්න මහතා මෙහිදී සඳහන් කළේය. විශේෂයෙන් දැනට සේවයේ නිරත විනිසුරුවරයන් නම් වශයෙන් සඳහන් කරමින් ප්‍රකාශ නිකුත් කිරීම ද දක්නට ලැබුණු බැවින් මෙම තත්ත්වය පිළිබඳව නීතිඥ සංගමයේ කනගාටුව පළ කරන බවද ඔවුහු පැවසූහ.

එබැවින් මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස කථානායකවරයාගෙන් ඉල්ලා සිටි නීතිඥ සංගමයේ සභාපතිවරයා මීට අදාළ ලිඛිත ඉල්ලීමක් ද කථානායකවරයා වෙත භාරදීම සිදු කළේය.

මෙහිදී අදහස් දක්වමින් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සඳහන් කළේ මෙරට විනිසුරුවරයන් ඇතුළු අධිකරණයේ ගෞරවය ආරක්ෂා කිරීමට තමා නිරතුරුව පෙනී සිටින බවයි. එබැවින් මේ සම්බන්ධව ඉදිරියේදී ගරු මන්ත්‍රීවරයන්ගේ අවධානයට යොමු කිරීමට අපේක්ෂා කරන බවත් කථානායකවරයා පැවසීය.

නීතිඥ සංගමය සංගමය නියෝජනය කරමින් එහි නියෝජ්‍ය සභාපති නීතිඥ නලින්ද ඉන්ද්‍රතිස්ස, ලේකම් නීතිඥ ඉසුරු බාලපටබැඳි, භාණ්ඩාගාරික නීතිඥ චමත් ජයසේකර, සහකාර ලේකම් නීතිඥ මෙහෙරාන් කරීම් යන මහත්වරු ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.





# එක්සත් රාජධානියේ මහ කොමසාරිස් ඇන්ඩෲ පැට්‍රික් මහතා සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක්




ශ්‍රී ලංකාවේ එක්සත් රාජධානියේ මහ කොමසාරිස්වරයා ලෙස අභිනවයෙන් පත්වූ ඇන්ඩෲ පැට්‍රික් මහතා සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක් මේ මස 12 වැනිදා පාර්ලිමේන්තුවේ දී පැවැත්විණ. මෙම හමුවට පාර්ලිමේන්තුවේ මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මියද එක්ව සිටියාය.

දෙරට පාර්ලිමේන්තු අතර සබඳතා තවදුරටත් වැඩිදියුණු කිරීමට තමා බලාපොරුත්තුවන බව එක්සත් රාජධානියේ මහ කොමසාරිස් ඇන්ඩෲ පැට්‍රික් මහතා මෙහිදී සඳහන් කළේය. මේ අතර, අලුතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා - එක්සත් රාජධානි පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය පිළිබඳවද මෙහිදී සාකච්ඡා කරන ලදී.

මෙහිදී පොදුරාජ්‍ය මණ්ඩල පාර්ලිමේන්තු සංගමය හරහා ක්‍රියාත්මක වන වැඩසටහන් පිළබඳව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පැහැදිලි කළ අතර එක්සත් රාජධානිය දක්වන සහයෝගය පිළිබඳ ස්තුතිය පළ කළේය.

මෙයට අමතරව, පාර්ලිමේන්තු හුවමාරු වැඩසටහන්, පක්ෂ නායකයන්ට හා මන්ත්‍රීවරයන්ට පාර්ලිමේන්තුවේ ප්‍රශ්න ඇසීමට ඇති අවස්ථා, පාර්ලිමේන්තුවේ පවතින මූල්‍ය කාරක සභා සහ ආංශික අධීක්ෂණ කාරක සභා ඇතුළු කරුණු පිළිබඳව ද දෙපාර්ශ්වය අතර සාකච්ඡා පැවැත්විණ.





# කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ දරුවන් 700ක් පාර්ලිමේන්තුවට



කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ 7 සහ 8 ශ්‍රේණිවල දරුවන් 700ක පමණ පිරිසක් මේ මස 13 වැනිදා පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරතවූහ.

මෙහිදී පාර්ලිමේන්තු සන්නිවේදන දෙපාර්තමේන්තුවේ, මහජන සේවා අංශය මගින් එම දරුවන් ඇතුළු ගුරුවරු පිරිසට පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව අවශ්‍ය දැනුවත්කිරීම් සිදුකිරීමට කටයුතු කරන ලදී.

නිරීක්ෂණ චාරිකාවෙන් අනතුරුව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් බණ්ඩාර, වෛත්‍රධාරි නරේන්ද්‍ර ප්‍රනාන්දු, නියෝජ්‍ය වෛත්‍රධාරි කුෂාන් සම්පත් ජයරත්න,සහකාර වෛත්‍රධාරි එන්. අචින්ත එස්. කුරේ යන මහත්වරුන් සමග අදහස් හුවමාරු කරගනිමින් ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමටද එම දරුවන්ට අවස්ථාව උදාවුණි.







පුවත්

# මහජන අවකාශය තුළ පාර්ලිමේන්තුවේ භූමිකාව පිළිබඳ විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කෙරේ.

මහජන අවකාශය තුළ පාර්ලිමේන්තුවේ භූමිකාව පිළිබඳ විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් මේ මස පාර්ලිමේන්තුවේදී පැවත්විණි. පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහනට රජරට විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය නියෝජනය කරමින් සිසුන් සියයකට අධික පිරිසක් සහභාගී වූහ.

එහිදි පාර්ලිමේන්තුවේ කාරක සභා ක්‍රියාවලිය පිළිබඳ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) නිශාන්ති එස්. වික්‍රමරත්න මහත්මිය සිසුන් දැනුවත් කළ අතර, පාර්ලිමේන්තුවේ කාර්යභාරය සහ නීති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳ අදහස් දක්වන ලද්දේ සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) ඩී. ඩී. යූ. කේ. මුණසිංහ මහතා විසිනි.





පාර්ලිමේන්තුවට මහජන ප්‍රවේශයක් මැයෙන් පාර්ලිමේන්තුවේ මහජන සේවා කළමනාකාරිණි බුද්ධිනී රාමනායක මෙනවිය විසින් සිය අදහස් දැක්වූ අතර පාර්ලිමේන්තු ක්‍රමවේදය සහ ක්‍රියාපටිපාටි පිළිබඳ සිසුන්ගේ ප්‍රශ්න ඇසීමේ අවස්ථාව මෙහෙයවන ලද්දේ පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ පරිපාලන ජී. තච්චනාරාණි මෙනවිය විසිනි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කරන ලද වටිනා පොත් කට්ටලය බැගින් විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා බෙදා දීම මෙහිදී සිදු කරන ලද අතර රජරට විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යන අංශයේ අංශාධිපති මහාචාර්ය ඊ. එම්. එස්. ඒකනායක මහතා ඇතුළු කොළඹ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලවල ආචාර්යවරු සහ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් විසින් සිය අදහස් දැක්වීම් සිදු කෙරිණි.



# කොරියානු රැකියා හා කම්කරු අමාත්‍යවරයා සහ කථානායකවරයා අතර හමුවක්



කොරියානු ජනරජයේ රැකියා හා කම්කරු අමාත්‍ය ගරු ලී ජුං-සික් (Lee Jung-sik) මහතා ප්‍රමුඛ දූත පිරිසක් සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක් මේ මස 15 වැනි දින පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. මෙම අවස්ථාවට පාර්ලිමේන්තුවේ මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය සහ ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති මියොන් ලී මහත්මිය එක්ව සිටියහ.


මෙහිදී අදහස් දැක්වූ කොරියානු රැකියා හා කම්කරු අමාත්‍ය ගරු ලී ජුං-සික් මහතා සඳහන් කළේ, වත්මන් ආර්ථික හා සමාජීය වෙනස්කම්වලට අනුව කොරියානු රැකියා බලපත්‍ර ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කෙරෙන අතර එමඟින් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හට ලබා දෙන රැකියා කෝටාව වැඩි කිරීම අපේක්ෂා කරන බවයි. මෙම ප්‍රතිව්‍යුහගතකරණය තුළින් ශ්‍රී ලංකාවට ඇති අවස්ථා විශේෂයෙන්ම විවිධ කර්මාන්ත අංශ සහ විශේෂිත සේවා අංශය වෙත පුළුල් කිරීමට තමන් බලාපොරොත්තු වන බව ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.



මෙයට අමතරව, ශ්‍රී ලාංකිකයින්ට කොරියානු භාෂාව ඉගැන්වීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සිය ප්‍රසාදය පළ කළ කොරියානු රැකියා සහ කර්මාන්ත අමාත්‍යවරයා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) සහ අනෙකුත් සහයෝගීතා වැඩසටහන් තවදුරටත් ඉදිරියට ගෙන යාමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කළේය.

කොරියානු රැකියාවල නිරතවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් හරහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල ප්‍රතිලාභ ලැබෙන බවත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට විවධ රැකියා අංශ හරහා සේවයේ නිරතවීමට වැඩි අවස්ථාවන් ලබා දෙන ලෙස කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මෙහිදී ඉල්ලීමක් සිදු කළේය. එමෙන්ම කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA) ශ්‍රී ලංකාවට නිරතුරුව ලබාදෙන සහය පිළිබඳව ද කථානායකවරයා සිය කෘතවේදීත්වය පළ කළේය.





# කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සහ බංගලාදේශ කථානායක (ආචාර්ය) ශිරින් ෂර්මින් චෞද්රි මහත්මිය අතර හමුවක්



නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණ සිටින බංග්ලාදේශ කථානායක ගරු (ආචාර්ය) ශිරින් ෂර්මින් චෞද්රි (Shirin Sharmin Chaudhury) මහත්මිය සහ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක් මෙම මස 18වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි. මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මහලේකම් කුෂානි රෝහණදීර මහත්මිය සහ ශ්‍රී ලංකාවේ බංග්ලාදේශ මහ කොමසාරිස් තාරික් මොහොමඩ් අරිෆුල් ඉස්ලාම් යන මහත්ම මහත්මීහු ද එක්ව සිටියහ.

කෙටි කාලයක් තුළ ශ්‍රී ලංකාවට පැවති ආර්ථික අර්බුදයෙන් මිදීමට හැකිවීම පිළිබඳව බංග්ලාදේශ කථානායක ගරු (ආචාර්ය) ශිරින් ෂර්මින් චෞද්රි මහත්මිය මෙහිදී තම ප්‍රසාදය පළ කළාය. තවද,2024 මුලදී පැවැත්වීමට නියමිත බංග්ලාදේශ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු දෙරට අතර පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ප්‍රතිස්ථාපනය කිරීමට අපේක්ෂා කරන බවද ඇය ප්‍රකාශ කළාය.



එමෙන්ම, බංගලාදේශයේ නිල සංචාරයක් සඳහා පැමිණෙන ලෙසට කතානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට බංග්ලාදේශ කථානායකවරිය මෙහිදී ආරාධනා කළාය.

එයට අමතරව, දෙරටේ පාර්ලිමේන්තු ක්‍රමය, සෞඛ්‍ය සේවාව, කර්මාන්ත ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය, ආයෝජන සහ අපනයන ආදී කරුණු සම්බන්ධයෙන් ද දෙපාර්ශවය අතර සාකච්ඡා පැවැත්විණි.

මෙම හමුවීමෙන් අනතුරුව බංග්ලාදේශ කථානායක ගරු (ආචාර්ය) ශිරින් ෂර්මින් චෞද්රි මහත්මිය පාර්ලිමේන්තුවේ විශේෂ ආරාධිතයන් සඳහා වූ සටහන් පොතේ හි අත්සන් තැබීම ද සිදු කළාය.





# ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන සාර්ථකව නිමකළ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට සහතිකපත් සහ තිළිණ ප්‍රදානය කෙරේ





ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනය (NILET) විසින් පවත්වන ලද "ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන" සාර්ථකව නිමකළ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සහතිකපත්‍ර සහ තිළිණ ප්‍රදානය කිරීමේ "ත්‍යාග ප්‍රධානෝත්සවය"මේ මස 13 වැනිදා පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැත්විණි.

මෙම සහතික සහ තිළිණ ප්‍රදානෝත්සවයට පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් හංස අබේරත්න, අධ්‍යක්ෂ (පරිපාලන) ජී.තච්චාරණී මෙනවිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍යාමා ප්‍රනාන්දු මහත්මිය සහ ප්‍රධාන නිලධාරි (මානව සම්පත් සංවර්ධන) මංජුලා විතානගේ මහත්මිය ඇතුළු පිරිසක් සහභාගි වූහ.

එමෙන්ම, ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනය(NILET) නියෝජනය කරමින් එහි සභාපති ජයම්පති බණ්ඩාර හීන්කෙන්ද මහතා සහ වැඩබලන සහකාර අධ්‍යක්ෂ පී.පී.රවිරාජ් මහතා සහ ඇතුළු නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.







පුවත්

# බදුල්ල දිස්ත්‍රික්කයේ දමිල මාධ්‍ය පාසැල් 26ක ශිෂ්‍ය පාර්ලිමේන්තු සහභාගීත්වයෙන් ‘පාර්ලිමේන්තු විදු පියස’ සිසුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩමුළුවක් බණ්ඩාරවෙලදී



බදුල්ල දිස්ත්‍රික්කයේ දමිල මාධ්‍ය පාසැල් 26ක ශිෂ්‍ය පාර්ලිමේන්තු සාමාජික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වයෙන් “පාර්ලිමේන්තු විදු පියස”වැඩසටහනේ තවත් සුවිශේෂී වැඩමුළුවක් මේ මස බණ්ඩාරවෙල දමිල මධ්‍ය මහා විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී සාර්ථකව පැවැත්විණි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මහජන සේවා අංශය විසින් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය (NDI) සමග එක්ව සංවිධානය කළ මෙම වැඩමුළුවේදී අනාගත තරුණ පුරවැසියන් ලෙස පාසැල් ප්‍රජාව පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් දැනුවත් විය යුතු තොරතුරු වඩාත් සරළව ඉදිරිපත් කෙරිණි. විවිධ ප්‍රායෝගික අංගවලින් සමන්විත වැඩසටහන සඳහා දරුවන් සහ ගුරුවරු සියලු දෙනා අතිශය උදේ‍යාගයෙන් යුතුව සම්බන්ධවී සිටින අයුරු දැකිය හැකි විය.

මෙම පාර්ලිමේන්තු විදු පියස වැඩසටහන සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, අධ්‍යක්ෂ පරිපාලන ජී.තච්චනාරාණි සහ මහජන සේවා නිලධාරී පී. රුද්‍රකුමාර් යන මහත්ම මහත්මීහු පාර්ලිමේන්තු ක්‍රමවේදය සහ ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධව සිසුන් දැනුවත් කිරීම සඳහා සම්පත් දායකයන් ලෙස සහභාගී වූහ.

මෙම වැඩසටහන පැවති බණ්ඩාරවෙල දමිල මධ්‍ය මහා විද්‍යාලීය ආදි ශිෂ්‍යාවක් ලෙස එම විදුහල් ඉතිහාසයේ විශ්ව විද්‍යාල වරම් ලැබූ පළමු ශිෂ්‍යයා බවට පත්වූ පාර්ලිමේන්තුවේ වත්මන් පරිපාලන අධ්‍යක්ෂ ජී තච්චනාරාණි මෙනවිය සඳහා උපහාර පිදීමක් ද මෙහිදී සිදුවිය.

බණ්ඩාරවෙල දමිල මධ්‍ය මහා විද්‍යාලය විදුහල්පති කේ. චන්ද්‍රරාජා, බණ්ඩාරවෙල කලාප ගුරු උපදේශිකා දේවගී යන මහත්ම මහත්මීන්ද පාර්ලිමේන්තුවේ මාධ්‍ය කළමනාකාරිණි නිම්මි හාතියල්දෙණිය, මහජන සේවා නිලධාරිනි ඉෂාරා වික්‍රමසිංහ, මාධ්‍ය නිලධාරී මහේශ්වරන් ප්‍රසාත් සහ සෞම්‍ය ඒකනායක, මහජන සේවා සම්බන්ධීකාරක පියසිරි අමරසිංහ යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක්ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

වැඩසටහන අවසානයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පැමිණි සියලු ආරාධිත පාසැල් පුස්තකාල සඳහා ග්‍රන්ථ කට්ටල ප්‍රදානයක් ද සිදුවිය.

# කාරක සභා පුවත්



# මෙරට පාසල් දරුවන්ගේ ප්‍රජනක සෞඛ්‍ය සහ ලිංගික අධ්‍යාපනය මෙන්ම දරුවන්ට එරෙහි සයිබර් ප්‍රචණ්ඩත්වය පිළිබඳව ළමුන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ අවධානය.



මෙරට පාසල් දරුවන්ගේ ප්‍රජනක සෞඛ්‍ය සහ ලිංගික අධ්‍යාපනය මෙන්ම දරුවන්ට එරෙහි සයිබර් ප්‍රචණ්ඩත්වය පිළිබඳව පසුගියදා පැවති ළමුන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ අවධානය යොමු විය.

එම කාරක සභාව පසුගියදා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ සභාපතීත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී මේ පිළිබඳව සාකච්ඡා විය.

පාසල් ළමුන්ගේ ප්‍රජනක සෞඛ්‍ය සහ ලිංගික අධ්‍යාපනය පිළිබඳව මෙරට ජනතාව අන්තර්ජාලය ඔස්සේ නව මාධ්‍ය ක්‍රම හරහා දැනුවත්කිරීම ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව මෙහිදී නිලධාරීහු පැවසූහ. සංසදයේ සභාපතිනිය නිලධාරීන්ගේ උත්සාහය අගය කරමින් කියා සිටියේ මෙම වැඩසටහන සඳහා සංසදය පූර්ණ සහය ලබාදීමට අපේක්ෂා කරන බවයි.

සමාජයේ විවිධ  කණ්ඩායම්වලට උචිත පරිදි වඩා හොඳ අවබෝධයක් ලබා දීම සඳහා ප්‍රජනක සෞඛ්‍ය සහ ලිංගික අධ්‍යාපනයට අදාළ අන්තර්ගතයන් නිර්මාණය කිරීමේ අවශ්‍යතාව ද මෙහිදී සාකච්ඡා විය.



ළමුන් අතර මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සහ ළමා අයිතිවාසිකම් පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය. තවද දරුවන්ට තම ගැටලු අප්‍රකටව ඉදිරිපත් කළ හැකි පැමිණිලි පෙට්ටියක් පාසැල්වල ට නැවත හඳුන්වා දීම පිළිබඳව ද කමිටුව සොයා බැලීය.

ශ්‍රී ලංකාවේ ළමයින්ට එරෙහි සයිබර් ප්‍රචණ්ඩත්වයට අදාළ නෛතික තත්ත්වය පිළිබඳව ද කමිටුව විසින් සොයා බලන ලදී. සයිබර් අපරාධ වැළැක්වීම සඳහා පනත් කෙටුම්පතක් ඉදිරියේදී ගෙන ඒමට නියමිත බවත් හෙළි විය. ළමා අසභ්‍ය දර්ශන සහිත වෙබ් අඩවි, ෆෙස්බුක් පිටු ඇතුළු බොහෝ වෙබ් අඩවි ක්‍රියාත්මක බවත් ඒවා නැවැත්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් අවධානය යොමුවිය..

ළමුන් සම්බන්ධ සිද්ධීන් පිළිබඳ බොහෝ මාධ්‍ය වාර්තා ඉතා සදාචාර විරෝධී මට්ටමක පවතින බැවින් බැවින් විධිමත් මාධ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පිළිබඳවද සාකච්ඡා විය.





කාරක සභා පුවත්

# සිවිල් ආරක්ෂක බලකාය නවීකරණය කිරීම මගින් රටට වැඩදායී සේවයක් ලබා ගැනීමට කටයුතු කරනවා - රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්

සිවිල් ආරක්ෂක බලකාය නවීකරණය කිරීම මගින් රටට වැඩදායී සේවයක් ලබාගැනීමට කටයුතු කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා පැවසීය.

රාජ්‍ය අමාත්‍යවරයා මේබව පැවසුවේ ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කරක සභාව ඒ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය. මෙම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිත්වය දරන්නේ ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසිනි.



මෙහිදී දීර්ඝ වශයෙන් සිවිල් ආරක්ෂක බලකාය සම්බන්ධයෙන් සාකච්ඡා වීම සිදු වූ අතර අලි මිනිස් ගැටුම සමනය කිරීම සඳහා සිවිල් ආරක්ෂක බලකායේ නිලධාරීන්ගෙන් ඉහළ සහයක් ලැබෙන බවද පැමිණ සිටි මන්ත්‍රීවරු සඳහන් කළහ. එසේම මෙම නිලධාරීන්ට අවශ්‍ය ඉන්ධන පහසුකම් සහ අනෙකුත් පහසුකම් ලබාදීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.

එසේම කැලෑ ගිනිතැබීම් විශාල වශයෙන් පසුගිය කාලසීමාව තුළ වාර්තා වූ බවත් ඒවා නැවැත්වීමට වැඩපිළිවෙළක් ආරම්භ කරන බවත් අමාත්‍ය ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සඳහන් කළේය.







කාරක සභා පුවත්

# පෞද්ගලික වාහන හැර අනෙකුත් වාහන ආනයන සීමා 2023 වසර අවසන් වන විට ඉවත් කරනවා - මුදල් අමාත්‍යාංශය රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවට පවසයි

2023 වසර අවසන් වන විට පෞද්ගලික වාහන හැර අනෙකුත් වාහන ආනයනය සඳහා පනවා ඇති සියලුම සීමා ඉවත් කිරීමට අදහස් කරන බව මුදල් අමාත්‍යාංශ නිලධාරීහු පාර්ලිමේන්තුවේ පැවති රජයේ මුදල් පිළිබද කාරක සභාවේදී  අනාවරණ කළහ.
විශේෂයෙන්  එවැනි සීමා කිරීම් හමුවේ තිරිගු පිටි, ටයිල් වැනි කර්මාන්ත වල මෙන් ද්විඅධිකාරි තත්ත්වයක් ඇති වීම වළක්වා ගැනීමේ වැදගත්කම අවධාරණය කරමින් මෙම වාහන ආනයන සීමා කිරීම් කොපමණ කාලයක් ක්‍රියාත්මක වේද යන්න පිළිබඳව කාරක සභාව විමසා සිටි අවස්ථාවේදී නිලධාරීහු මේ බව පැවසූහ.





පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 05 වනදා රජයේ මුදල් පිළිබද කාරක සභාව රැස්වූ අවස්ථාවේදී මෙම කරුණු සාකච්ඡා විය.

කමිටුව  විසින් 2023.07.20 දිනැති අංක 2341/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඇති රෙගුලාසි පිළිබදව අවධානය යොමු කළ අතර ඊට අනුමතිය ලබා දෙන ලදී.

තවද 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ අංක 2338/40 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති නියෝගය ද කාරක සභාවේදී සලකා බලා අනුමත කරන ලදී. මෙහිදී සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සදහා සුදුසු සංක්‍රමනික දීමනාව ඇ.ඩො. 30000 සිට ඇ.ඩො 50000 ක උපරිමය දක්වා හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා වැඩි කිරීම සිදුවේ.

එවැනි නියෝගයකට පෙර වර්ෂයේ සංක්‍රමණය වූ අය සඳහා පවතින සාධාරණත්වය පිළිබඳ එහිදී  කමිටුව ප්‍රශ්න කළේය. මෙහිදී ඔවුන්ට ඉතිරි මුදල ලෙස උපරිම ඇ.ඩො. 20,000ක් දක්වා ලබාගත හැකි බව පැමිණ සිටි නිලධාරීහු ප්‍රකාශ කළහ.







# මත් ද්‍රව්‍ය විනාශ කිරීමේ මධ්‍යස්ථානයක් සකස් කිරීමේ වර්තමාන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී සාකච්ඡා වේ.

**■රස පරීක්ෂක වාර්තා ප්‍රමාදවීම පිළිබඳ අවධානය**

**■ඊසි කෑෂ් (ez cash) මගින් සිදු වන මුදල් ගනුදෙනු නැවැත්වීමට අවධානය**



රට තුළ ශීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳ කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී සාකච්ඡා විය.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ එම කාරක සභාව අමාත්‍ය ගරු ටිරාන් අලස් මහතාගේ සභාපතිත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙම කාරක සභාව සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, අධිකරණ, බන්ධනාගාර හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, තැපැල් දෙපාර්තමේන්තුව සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව කැඳවා තිබූ අතර මෙරට මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීම සඳහා මෙම අංශ ගෙන ඇති පියවර පිළිබඳ සාකච්ඡා කිරීම සිදු විය.

මෙහිදී මත් ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා පත්කොට ඇති ජනාධිපති කාර්යසාධක බලකායේ සභාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මහතා කමිටුව අමතමින් සඳහන් කළේ මත් ද්‍රව්‍ය විනාශ කිරීමේ මධ්‍යස්ථානයක් කල්පිටිය ප්‍රදේශයේ ඉදිකරන බවත් මේ සඳහා ජලය, විදුලිය සහ මාර්ග පහසුකම් ලබාගැනීමට මෙම කමිටුව මැදිහත් වන්නේ නම් මෙම වසර අවසානයේ මෙම මධ්‍යස්ථානය සකස් කොට අවසන් කළ හැකි බවයි. මේ අනුව මේ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කරන බව කාරක සභාවේ සභාපති අමාත්‍ය ටිරාන් අලස් මහතා සඳහන් කළේය.

එසේම රස පරීක්ෂක වාර්තා ප්‍රමාදවීම පිළිබඳවද මෙහිදී පැමිණ සිටි මන්ත්‍රීවරුන් විමසා සිටි අතර නිලධාරීන් සඳහන් කළේ පසුගිය කාලයේ මේ සඳහා මාස 9 පමණ කාලයක් ගත වූ බවත් වර්තමානයේ මාස 3 පමණ කාලයක් ගත වන බවත්ය. නිලධාරීන්ගේ හිගය මේ සඳහා බලපා ඇති බවත් ඒ අනුව අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බවත් පැමිණ සිටි නිලධාරීහු සඳහන් කළහ.

තවද ඊසි කෑෂ් (ez cash) මගින් සිදු වන මුදල් ගනුදෙනු මගින් මත් ද්‍රව්‍ය අලෙවි කිරීම සිදු වන බවත් මේ වෙනුවෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳවත් මෙහිදී සාකච්ඡා විය.







කාරක සභා පුවත්

# මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් ආරක්ෂිත බදු මුද්‍රාව (ස්ටිකරය) ව්‍යාජ ලෙස භාවිතා කිරීමට එරෙහිව නිර්දේශ ලබා දුන්නේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවයි - කමිටු සභාපති පාඨලී චම්පික රණවක මහතා



ඇතැම් මත්පැන් නිෂ්පාදන සමාගම් විසින් ආරක්ෂිත බදු මුද්‍රාව (ස්ටිකරය) ව්‍යාජ ලෙස භාවිතා කිරීම මගින් රජයට සුවිශාල බදු ආදායමක් අහිමි වීම සම්බන්ධයෙන් මුලින්ම සාකච්ඡා ආරම්භ කරනු ලැබුවේ සහ උක්ත ක්‍රියාවලියට එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ලබා දෙනු ලැබුවේ පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් බව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතා පැවසීය.

ඒ මහතා මේ බව සඳහන් කළේ මත්පැන් බෝතල්වල ව්‍යාජ ආරක්ෂිත ස්ටිකර් ඇලවීමට සම්බන්ධ සමාගම්වලට එරෙහිව පියවර ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශය විසින් නිර්දේශ කර ඇති බවට 2023.09.03 දින ඇතැම් මාධ්‍යවල පල වී තිබූ මාධ්‍ය වාර්තා පිළිබඳ අදහස් දක්වමිනි.

පාර්ලිමේන්තුවේ මෑතදී පිහිටුවන ලද මූල්‍ය අධීක්ෂණ කාරක සභාවක් වශයෙන් ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාවට, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව රජයේ ප්‍රධාන ආදායම් උපදවන ආයතන ත්‍රිත්වය වන ශ්‍රී ලංකා රේගුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතනවල ක්‍රියාකාරිත්වය හා එම ආයතනවල සඵලදායී ආදායම් රැස් කිරීමේ යාන්ත්‍රණ සම්බන්ධයෙන්ද, බදුකරණය හා තීරු ගාස්තු හා රජයට අමතර ආදායම් රැස් කිරීම සඳහා අවශ්‍ය වන සියළු කාරණා සම්බන්ධයෙන්ද පරීක්ෂා කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා බලය හිමි බවද සභාපතිවරයා පැවසීය.

මෙම කරුණ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව හා අදාළ අනෙකුත් පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් පැවති කාරක සභාවේ රැස්වීම් ගණනාවකදී පුළුල් ලෙස පරීක්ෂාවට ලක් කරනු ලැබූ අතර මෙම නීතිවිරෝධී ක්‍රියාවලියේ නිරත වන මත්පැන් නිෂ්පාදන සමාගම්වලට එරෙහිව ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ගතයුතු පියවර හා එම පියවර ගත යුතු කාලසීමාවද සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කොට තිබෙන බවද සභාපතිවරයා තවදුරටත් සඳහන් කළේය.




කාරක සභා පුවත්

# දරුවන් සහ කාන්තාවන් සිගමනට යොදා ගැනීම නතර කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් - අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී සාකච්ඡා කෙරේ




දරුවන් සහ කාන්තාවන් වැඩි වශයෙන් මේ වන විට ව්‍යාපාරයක් ලෙස සිගමනට යොදා ගන්නා බව වාර්තාවී ඇති බැවින් මෙම තත්ත්වය නතර කිරීම සඳහා කඩිනමින් ක්‍රියාත්මක වීමට පියවර ගන්නා බව රාජ්‍ය අමාත්‍ය ගරු ගීතා කුමාරසිංහ මහත්මිය පැවසුවාය. මේ අනුව පොලිසිය, පළාත් පාලන ආයතන, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඇතුළු අදාළ ආයතන සමග මූලික සාකච්ඡාවක් පවත්වා එම කටයුතු අරඹන බව ද රාජ්‍ය අමාත්‍යවරිය විසින් පෙන්වා දෙන ලදී.

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රාජ්‍ය අමාත්‍ය ගරු ගීතා කුමාරසිංහ මහත්මිය සහ රාජ්‍ය අමාත්‍ය ගරු අනුප පැස්කුවල් මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදී මේ පිළිබඳව අවධානය යොමු විය.



මේ වන විට සිගමන් යැදීම සඳහා දරුවන් කුලියට ගැනීම, ඇතැම් දරුවන්ට මත්පෙති ලබා දී සිගමන සඳහා යොදා ගැනීම, කාන්තාවන් ව්‍යාජ ලෙස ගැබිනි කාන්තාවන් සේ පෙනී සිටීම ආදිය බහුලව සිදුවන බැවින් සිගමනේ යෙදීම ව්‍යාපාරයක් බවට පත්ව ඇති බව මෙහිදී සාකච්ඡා විය. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා නෛතික ප්‍රතිපාදන පැවතියද ප්‍රායෝගික තලයේ නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ ගැටලු පිළිබඳව ද මෙහිදී අවධානය යොමු විය.

සමාජ සේවා දෙපාර්තමේන්තුව සැප්තැම්බර් මස ආරම්භ කිරීමට නියමිත මෙරට යාචකයන් පිළිබඳ සමීක්ෂණ සමග ද සම්බන්ධ වෙමින් අදාළ දත්ත ලබා ගැනීමට පියවර ගන්නා ලෙස මෙහිදී රාජ්‍ය අමාත්‍යවරයන් විසින් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

මේ අනුව එළඹෙන සතියේ මේ පිළිබඳව විශේෂ සාකච්ඡාවක් සූදානම්කොට කඩිනම් පියවර ගැනීමට මෙහිදී වැඩිදුරටත් තීරණය විය.



කාරක සභා පුවත්

# ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ඩලස් අලහප්පෙරුම මහතා පත්වෙයි.

**■ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය කැඳවා අදහස් හා යෝජනා ලබාගැනීමට කමිටු සභාපති වරයාගෙන් උපදෙස්**



ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ සභාපතිවරයා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩලස් අලහප්පෙරුම මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු ( මහාචාර්ය ) චරිත හේරත් සහ ( විශේෂඥ වෛද්‍ය ) ගරු සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ යන මහත්ම මහත්මීන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් මේ මස 06 වැනිදා එම සංසදය පළමුවරට රැස්වූ අවස්ථාවේදී තෝරා පත්කර ගන්නා ලදී. නියෝජ්‍ය සම සභාපතිවරුන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු වීරසුමන වීරසිංහ සහ ගරු කරුණාදාස කොඩිතුවක්කු යන මහත්වරුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ, ගරු මධුර විතානගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් මාන්නප්පෙරුම යන මහත්වරුන් තෝරා පත්කර ගන්නා ලදී.





කමිටුවේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව අදහස් දක්වමින් කමිටු සභාපතිවරයා, ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලය ප්‍රථමයෙන්ම සාකච්ඡාවක් සඳහා කැඳවීමට උපදෙස් ලබාදෙන ලදී. එමගින් වර්තමානයේ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳව තොරතුරු හා දත්ත මෙන්ම එම කාර්යාලය ගෙනයන වැඩ පිළිවෙල සම්බන්දයෙන් කමිටුවට අවබෝධයක් ලබගත හැකි බව සභාපතිවරයා සඳහන් කළේය.

අධ්‍යාපනය ,ප්‍රවාහනය ,නීති හා සෞඛ්‍ය යන අංශ තුල ආබාධ සහිත තැනැත්තන්ට බහුලව ගැටලු පවතින බව වැඩි දුරටත් අදහස් දක්වමින් සභාපතිවරයා පැවසීය. ඒ අනුව ඉදිරියේදී ආබාධ සහිත තැනැත්තන් වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන කැඳවා ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීමට තීරණය විය.

මෙරට සිදුකර ඇති අවසන් ජන සංගණනය 2012 වසරේ සිදුකර ඇති බැවින් වර්තමානයේ කොපමණ ආබාධ සහිත තැනැත්තන් සිටිනවාද යන්න පිළිබඳ යාවත්කාලීන දත්ත ලබා ගැනීමේ අවශ්‍යතාවයද සභාපතිවරයා සිහිපත් කළේය.

පක්ෂ භේදයෙන් තොරව ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට සියලුම දෙනා කටයුතු කලයුතු බවද සභාපතිවරයා මෙහදී අවධාරණය කළේය.

මෙරට සිටින ආබාධ සහිත තැනැත්තන් පිළිබඳව දත්ත පද්ධතියක් සකස් කිරීමේ අවශ්‍යතාවය ගැන විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා කමිටුව හමුවේ කරුණු ඉරිපත් කළේය. ඒ අනුව අදාල දත්ත ලබාගැනීම ග්‍රාම නිලධාරීන් මගින් ආරම්භ කළ හැකි බවද විපක්ෂ නායකවරයා පැවසීය. ආබාධ සහිත තැනැත්තන්ට අනුකම්පාව නොව අයිතීන් ලබාදීම අරමුණු කරගෙන කටයුතු කලයුතු බවට මෙහිදී අදහස් දක්වමින් කමිටු සාමාජික මන්ත්‍රීවරයන් ප්‍රකාශ කළහ.

# ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන දුර්වලතා සහ අකුමිකතා රැසක් කෝප් කමිටුවේදී හෙළි වෙයි

**■ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම් ඉහළ නැංවීම සම්බන්ධයෙන්, පිරිවැය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් මාස 3ක් ඇතුළත යෝජනාවලියක් කෝප් කමිටුවට ලබාදීමට නිර්දේශ.**



පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 05 වැනි දින රැස්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කෝප් කමිටුව) ශ්‍රී ලංකා වරාය අධිකාරිය කැඳවා තිබිණි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආදායම් ඉහළ නැංවීම සම්බන්ධයෙන්, පිරිවැය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සම්බන්ධයෙන් යෝජනාවලි 3ක් කෝප් කමිටුවට ලබාදෙන ලෙස කමිටු සභාපති ගරු මහාචාර්ය රංජිත් බණ්ඩා මහතා නිර්දේශ කළේය. මෙහිදී එළඹෙන දෙසැම්බර් මස 08 වැනි දින වරාය අධිකාරිය කෝප් කමිටුවට කැඳවන බවත් ඉන් පෙර මෙම වාර්තා 3 කෝප් කමිටුවට ලබා දිය යුතු බවත් සභාපතිවරයා මෙහිදී නිර්දේශ කළේය.

මෙහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පසුගිය වර්ෂ කිහිපයක මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාකච්ඡා කිරීම සිදු වූ අතර එහිදී 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ශ්‍රී ලංකා වරාය අධිකාරිය උපයාගෙන තිබූ ලාබයෙන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු රුපියල් මිලියන 4.975 ක් නොගෙවීම පිළිබඳ කෝප් කමිටුව පැමිණ සිටි නිලධාරීන්ගෙන් විමසා සිටියේය. මෙහිදී පැමිණ සිටි නිලධාරීන් සඳහන් කළේ මාස දෙකක් ඇතුළත මෙම මුදල ගෙවීමට කටයුතු කරන බවයි.



නැගෙනහිර පර්යන්තයේ මෙහෙයුම් ධාරිතාව උපරිම කිරීමට විශාල ප්‍රමාණයේ දොඹකර 12 ක් සහ ස්වයංක්‍රීය ගැන්ට්‍රි දොඹකර 40 මිලදීගැනීමට කොන්ත්‍රාත්කරු සමග එළඹි ඇ.ඩො. මිලියන 282.56 ක ගිවිසුම සංශෝධනය නොකිරීම සම්බන්ධයෙන් කෝප් කමිටුව පැමිණි නිලධාරීන්ගෙන් විමසීම මෙහිදී සිදු විය. මෙහිදී පැමිණ සිටි නිලධාරීන් සඳහන් කළේ 2021 වර්ෂයේ මේ පිළිබඳ ගිවිසුම්වලට එළඹුන බවත් ලංකා බැංකුවෙන් ණය වර (LC) නිකුත් කළද රටේ පැවති තත්ත්වය නිසා මෙම ගෙවීම් සිදු කිරීමට නොහැකි වූ බවයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලු ගේට්ටු සහ බන්ධිත ගුදම් ආවරණය වන ආකාරයෙන් CCTV කැමරා සවි කිරීමේ කටයුතු සිදු නොකිරීම පිළිබඳ විමසා බැලීමද මෙහිදී සිදු විය. මෙහිදී අවශ්‍ය ස්ථාන සඳහා ක්‍රම ක්‍රමයෙන් CCTV කැමරා සවි කිරීම සිදු කරන බව පැමිණ සිටි නිලධාරීන් සඳහන් කළේය. මේ වන විට කැමරා 538 ක් සවි කර ඇති බවත් ඉදිරියේදී 400 පමණ සවිකරන බවත් එම නිලධාරීන් පෙන්වා දුන්නේය. මාස 6 ක් ඇතුළත මෙම CCTV කැමරා සවි කිරීමට කටයුතු කරන බවද පැමිණ සිටි නිලධාරීන් සඳහන් කළේය.

මෙම නිර්දේශවල ප්‍රගතිය සමාලෝචනය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2023 දෙසැම්බර් 08 දින නැවත කැඳවීමටත් මෙහිදී තීරණය විය.

කාරක සභා පුවත්

# බ්‍රික්ස් රටවල් සමග කටයුතු කිරීම ලංකාවට ආර්ථිකමය ලෙස වැදගත් - ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පවසයි.

**■බ්‍රික්ස් රටවල් සමග කටයුතු කිරීම ඔස්සේ ලැබෙන ප්‍රතිලාභ ගැන සාකච්ජාවක් පවත්වා වාර් තාවක් ඉදිරිපත් කරන්න - කමිටු සභාපති වරයාගෙන් උපදෙස්**






ලෝක ජනගහනයෙන් 41% ක් ජීවත් වන්නේත්, ලෝක දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 24% ක් සේම ලෝක වෙළඳ කටයුතුවලින් 16%ක් ක්‍රියාත්මක වන්නේ බ්‍රික්ස් රටවල් තුල බව ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී පැවසීය.

එමෙන්ම 2022 වසරේ මෙරට අපනයන වලින් 10.3% ක් සහ ආනයනයන්ගෙන් 47.3% ම සිදු කර ඇත්තේ බ්‍රික්ස් රටවල් වලින් බවත් මේ හේතූන් අනුව බ්‍රික්ස් රටවල් සමග කටයුතු කිරීම ආර්ථිකමය ලෙස වැදගත් වන බව මහ බැංකු නිලධාරීන් තව දුරටත් සඳහන් කළහ.



මේ පිළිබඳ කරුණු ඉදිරිපත්වුයේ බ්‍රික්ස් (බ්‍රසීලය, රුසියාව ,ඉන්දියාව ,චීනය, දකුණු අප්‍රිකාව) රටවල් සමග කටයුතු කිරීම ඔස්සේ මෙරටට ලබාගත හැකි සමාජ ,ආර්ථික ,දේශපාලන ප්‍රතිලාභ මොනවාද යන්න පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 05 වන දින පාර්ලිමේන්තුවේදී රැස්වූ අවස්ථාවේදීය.

ඒ අනුව බ්‍රික්ස් රටවල් සමග කටයුතු කිරීම ඔස්සේ සමාජ,ආර්ථික ,දේශපාලනමය වශයෙන් ලබාගත හැකි ප්‍රතිලාභ සම්බන්ධයෙන් විමසා බැලීමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ මුලිකත්වයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව හා මුදල් අමාත්‍යාංශය සමග විශේෂ සාකච්ජාවක් පවත්වා එහි වාර්ථාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට කාරක සභා සභාපතිවරයා විසින් නිර්දේශ ඉදිරිපත් කළේය.



කාරක සභා පුවත්

# ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සූදානමකින් තොරව කමිටුවට පැමිණීම පිළිබඳව කෝපා කමිටුවේ දැඩි අප්‍රසාදය

■විගණකාධි වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් පිළිතුරු දීමට පැමිණි නිලධාරීන් සූදානම් වී නැහැ - කෝපා කමිටුව

■ඔලිම්පික් තරගාවලියේ පවතින තරඟ සංඛ්‍යාව පිළිබඳව නිවැරදි පිළිතුරක් දීමට නිලධාරීන් අපොහොසත් වේ.




ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සූදානමකින් තොරව කමිටුව හමුවට පැමිණීම පිළිබඳ කෝපා කමිටුවේ දැඩි අප්‍රසාදය පළ විය.

මෙසේ මෙම ආයතන සඳහා අප්‍රසාදය පළ කෙරුණේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 හා 2021 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පිළිබඳ සාකච්ඡා කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 6 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ අවස්ථාවේදීය.

මෙහිදී විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් විමසීමේදී ඒ පිළිබඳ පිළිතුරු දීමට පැමිණි නිලධාරීන් අපොහොසත් විය. මේ අනුව කාරක සභාවේ සභාපතිවරයා සඳහන් කළේ සූදානමකින් තොරව මෙම නිලධාරීන් කාරක සභාවට පැමිණීම සම්බන්ධයෙන් දැඩි අප්‍රසාදය පළ කරන බවයි. විශේෂයෙන්ම රටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් විමසීමට මෙම ආයතන කැඳවූ බවත් ඒ පිළිබඳ කිසිදු සූදානමක් නිලධාරීන් සතු නොවන බවත් මෙහිදී කෝපා කමිටුව පෙන්වා දුන්නේය. මේ නිසා කෝපා කමිටුව අතර මග නවතමින් මෙම ආයතන දෙක නැවත 2023 ඔක්තෝබර් 20 දින කෝපා කමිටුව හමුවට කැඳවීමට තීරණය කළේය.

එසේම මෙහිදී කමිටුව විසින් පැමිණි නිලධාරීන්ගෙන් ඔලිම්පික් තරගාවලියේ පවතින තරඟ සංඛ්‍යාව පිළිබඳව විමසූ අතර ඒ සම්බන්ධයෙන් නිවැරදි පිළිතුරක් ලබාදීමට පැමිණි සිටි නිලධාරීන් අපොහොසත් විය. මේ අනුව මේ

එසේම අවසාන වශයෙන් ජාත්‍යන්තර මට්ටමේ ඇති ක්‍රීඩා තරඟාවලි පිළිබඳව සහ ඒවායේ ශ්‍රී ලංකාව නියෝජනය කරන ස්ථානය පිළිබඳව වාර්තාවක් කමිටුවට ලබා දෙන ලෙස නිර්දේශ කළේය. මෙම වාර්තාවේ ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඇති සම්බන්ධතාවය පෙන්වා දෙන ලෙසද කෝපා කමිටුව නිර්දේශ කළේය.






# කාන්තාවන් සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය සහ ජනාධිපතිවරයා අතර විශේෂ සාකච්ඡාවක්

ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට සහ අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත කාන්තාවන් සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීමේ පනත් කෙටුම්පත සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සාමාජිකාවන් සහ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා අතර විශේෂ සාකච්ඡාවක් මේ මස 06 වැනිදා පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.



කාන්තාවන් සඳහා පිහිටුවීමට නියමිත ජාතික කොමිෂන් සභාවේ බලතල, කාර්යයන් සහ සාමාජිකයන් පත්කිරීම පිළිබඳව සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පතෙහි අන්තර්ගතය පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරිණි. මෙම පනත් කෙටුම්පත් ඉතා ඉක්මනින් කැබිනට් මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු බව සහ ඒ සඳහා සිය පූර්ණ සහයෝගය ලබා දෙන බවද ජනධිපතිවරයා මෙහිදී පැවසීය.





මෙරට දේශපාලන ක්‍රියාවලිය තුළ කාන්තා නියෝජනය වැඩි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් පෙන්වා දෙන ලදී. විශේෂයෙන් පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් ඒ ඒ පක්ෂ විසින් ඉදිපත් කරනු ලබන ජාතික ලැයිස්තු සඳහා 50%ක කාන්තා නියෝජනයක් ඇතුළත් කිරීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරිණි. ජනාධිපතිවරයා මෙහිදී යෝජනා කළේ ඒ පිළිබඳ පක්ෂ නායකයන් සමග සාකච්ඡා කළයුතු බවයි.

මෙයට අමතරව මෙරට ක්‍රියාත්මක වන කොමිෂන් සභා සඳහා අනිවාර්ය කාන්තා නියෝජනයක් ඇතුළත් කිරීම පිළිබඳවද මෙහිදී සාකච්ඡා කෙරිණි.

විදේශගත වන ශ්‍රමිකයන් සඳහා ක්‍රමවත් වෘත්තීය පුහුණු පාඨමාලාවන් සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකයක් ලබා දීම අනිවාර්ය කිරීමේ වැදගත්කම පිළිබඳවද පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය සිය අදහස් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළේය. මෙහිදී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සඳහන් කළේ මෙරට ක්‍රියාත්මක වන සියළු වෘත්තීය පුහුණු ආයතන එක්කොට පොදු පරිපාලන ව්‍යුහයක් සකස් කළ යුතු බවයි.

කාන්තාවන් සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීමේ පනත් කෙටුම්පතට සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ පනත් කෙටුම්පතට අමතරව කාන්තාවන් සවිබල ගැන්වීම පිළිබඳ පනත් කෙටුම්පත පිළිබඳවද මෙහිදි දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිණි.

කාරක සභා පුවත්

# රාජ්‍ය ආයතනවලින් නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමට නොහැකි වීම නිවැරදි පුවත් ජනතාවට සමීප කිරීමට ප්‍රධාන බාධාවක් - ජනමාධ්‍ය ප්‍රධානීහු විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට පවසයි




ජනමාධ්‍ය වාර්තාකරණයේදී අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු රාජ්‍ය ආයතනවලින් නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීමට නොහැකිවීම වාර්තාකරණය සඳහා ප්‍රධාන බාධාවක් බව ජනමාධ්‍ය ආයතන ප්‍රධානීහු  මේ මස 15වැනි දින පාර්ලිමේන්තුවේදී පැවති විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී කරුණු දැක්වූහ.  විශේෂයෙන් ඇතැම් මාධ්‍ය ලේකම්වරුන් එම සම්බන්ධීකරණය නිසියාකාරව සිදු නොකිරීම නිසා රජයේ යහපත් සංවර්ධන වැඩසටහන් පවා ජනතාව අතරට ගෙනයාමට නොහැකි වී ඇති බව ඔවුහු පෙන්වා දුන්හ.

මේ අනුව මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලෙසත් ඊට අදාළ වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඊ.එම්.එස්.බී ජයසුන්දර මහතාට කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතාගේ සභාපතීත්වයෙන් එම කාරක සභාව  රැස්වූ අවස්ථාවේදී මෙම කරුණු සාකච්ඡා විය.

ප්‍රජාතන්ත්‍රවාදය යහපත් ලෙස ක්‍රියාත්මක වීම සඳහා ජනමාධ්‍ය සිදුකරන කාර්ය භාරය අගය කළ කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේ සමාජ පෙරගමන්කරුවෙක් වන ජනමාධ්‍යවේදීන්ට සහ ජනමාධ්‍ය ආයතනවලට පවතින ගැටලු හා බාධා විසඳා ඉදිරියට යාම සඳහා මෙම කාරක සභාවෙන් අවශ්‍ය නිර්දේශ සහ උපරිම සහය ලබා දෙන බවයි.

වෘත්තීය ජනමාධ්‍යවේදීන් බිහි කිරීම සඳහා පුහුණු ආයතනයක් පිහිටුවීම සම්බන්ධයෙන්ද අවධානය යොමු විය. මේ සම්බන්ධව දැනට පනත් කෙටුම්පතක් සකස් කරමින් පවතින බව ලේකම්වරයා පැවසීය. එම කටයුතු ප්‍රමාද නොකර කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදී. එසේම ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා කමිටුවක් ක්‍රියාත්මක බවත් ඒ සඳහා අදහස් යෝජනා ඉදිරිපත් කිරීමට ජනමාධ්‍ය ආයතන ප්‍රධානීන්ට ආරාධනා කරන බවත් ලේකම්වරයා පැවසීය.







කාරක සභා පුවත්

# ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ නම සංශෝධනය කිරීමට කාරක සභාවේ අනුමතිය.




ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්,ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ නම සංශෝධනය කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රී (නීතිඥ) ගරු මධුර විතානගේ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 21 වැනි දින පාර්ලිමේන්තුවේදී රැස්වූ කාරක සභාව තීරණය කරන ලදී.

"ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකය "( Ease of Doing Business Index ) ලෙස යොදන නම, යෝජිත ව්‍යාපාර සූදානම් (B- Ready) දර්ශකය ලෙස භාවිත කිරීමට ලෝක බැංකුව තීරණය කර ඇති බැවින් ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ නව නාමය, " යෝජිත ව්‍යාපාර සූදානම් (B- Ready) දර්ශකය, සඳහා සූදානම් වීමේදී මතුවන ප්‍රයෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර් දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව" ලෙස සංශෝධනයට කාරක සභාවේ කමිටු සාමාජිකයින් එකඟ වු අතර ඒ අනුව සංශෝධනයට එකඟ විය.











පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව තරුණ නායකයන් දැනුවත්කෙරේ







පාර්ලිමේන්තු ඡායා ගැලරිය




## බදුල්ල දිස්ත්‍රික්කයේ දමිල මාධ්‍ය පාසැල් 26ක ශිෂ්‍ය පාර්ලිමේන්තු සහභාගීත්වයෙන් 'පාර්ලිමේන්තු විදු පියස' සිසුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩමුළුවක් බණ්ඩාරවෙලදී

















මෙවර සටහන - එච්. ඊ. ජනකාන්ත සිල්වා - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**සැප්තැම්බර් 05 අඟහරුවාදා**

- "දේශීය ආදායම් (සංශෝධන)" පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තුවට දැනුම් දීම
- "සිවිල් ගුවන් සේවා (සංශෝධන)" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම
- "ආයුර්වේද (සංශෝධන)" පනත් කෙටුම්පත දෙවැනි වර සහ සංශෝධනසහිතව තුන්වැනි වර කියවීම පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
- "ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය" සහ "සමාධි ප්‍රජා සංවර්ධන" සංස්ථාගත කිරීමේ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් ද්විත්වය දෙවැනි වර කියවීම සහ පාර්ලිමේන්තුවේව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කිරීම
- 2021 ජනවාරි 7 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද "වත්කම් සහ වගකීම් ප්‍රකාශකිරීමේ (සංශෝධන)" පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීම

**සැප්තැම්බර් 06 බදාදා**

- "ආබාධ සහිත තැනැත්තන් සඳහා වන පාර්ලිමේන්තු සංසදයක් පිහිටුවීම" පිළිබඳ පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
- පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අලි සබ්රි රහීම් මහතාගේ නොමනා ක්‍රියා කලාපය පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට පාර්ලිමේන්තුව විසින් යොමු කිරීම
- විදේශ විනිමය පනත යටතේ නියමය සහ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම
- "ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)" පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවීම පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
- සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා කෙරෙහි විශ්වාස භංගත්වය පිළිබඳ විවාදය ආරම්භ කිරීම

**සැප්තැම්බර් 07 බ්‍රහස්පතින්දා**

- සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා කෙරෙහි විශ්වාස භංගත්වය පිළිබඳ විවාදය තවදුරටත් පවත්වාගෙන යාම
- "දේශීයආදායම් (සංශෝධන)" පනත් කෙටුම්පතට පක්ෂව ඡන්ද 103ක්ද, විපක්ෂව ඡන්ද 58ක්ද, වශයෙන් බෙදී දෙවැනි වර කියවීම සහ සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවීම පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම
- "සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)" පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සහ තුන්වැනි වර කියවීම

**සැප්තැම්බර් 08 සිකුරාදා**

- "එකතු කළ අගය මත බදු (සංශෝධන)" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම
- සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා කෙරෙහි විශ්වාස භංගත්වය පිළිබඳ යෝජනාවට පක්ෂව ඡන්ද 73ක්ද, විපක්ෂව ඡන්ද 113ක්ද, වශයෙන් බෙදී එම යෝජනා නිශ්ප්‍රභවීම
- "දේශීය ආදායම් (සංශෝධන)", "සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)", "ශ්‍රී ලංකා මහ බැංකු" සහ "බැංකු (විශේෂ විධිවිධාන)" පනත් කෙටුම්පත් හතර පිළිවෙළින් 2023 අංක 14, 15, 16 සහ 17 දරන පනත් වශයෙන් සහතිකය සටහන් කිරීම

### සැප්තැම්බර් 19 අඟහරුවාදා

- "එකතු කළ අගය මත බදු (සංශෝධන)" පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් කථානායකවරයා වෙත ලැබී තිබෙන බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
- ගාර්දිවසම් කොඩිකාර අප්පුහාමිල්ලාගේ චමින්ද කුමාර කුලරත්න මහතා කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් තනතුරට 2023 සැප්තැම්බර් 15 දින සිට පත්කර ඇති බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් යටතේ නියෝග පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම

### සැප්තැම්බර් 20 බදාදා

- "ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)" පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත 2023 අංක 18 දරන පනත වශයෙන් සහතිකය සටහන් කිරීම
- අත්‍යවශ්‍ය මහජන සේවා පනත සහ වන සංරක්ෂණ ආඥාපනත යටතේ පිළිවෙළින් ප්‍රකාශනය සහ නියෝග පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම
- "අත්‍යවශ්‍ය සේවා සපයන ආයතන විසින් සිදු කරන වැඩ වර්ජනවල බලපෑම" පිළිබඳව සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

### සැප්තැම්බර් 21 බ්‍රහස්පතින්දා

- පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ, "ශ්‍රේෂ්ඨාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුතු" බව පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
- පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේරහස්‍ය ලේඛන මහ ජනතාවට නිකුත් නොකිරීම සම්බන්ධයෙන් නිවැරදි තත්ත්වය පාර්ලිමේන්තුවට නිවේදනය කිරීම
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 2023 විභාගය කල් දැමීම සඳහා ඉල්ලීම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට අමාත්‍යාංශ නිවේදනයක් කිරීම
- "සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)" පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගැන්වීම

අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසින් අනුමතකිරීම

- "පාස්කු ඉරුදින ප්‍රහාරය සහ ජාතික ආරක්ෂාව පිළිබඳ වර්තමාන තත්ත්වය" පිළිබඳව සභාව කල් තැබීමේ විවාදය ආරම්භ කිරීම

### සැප්තැම්බර් 22 සිකුරාදා

- පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අලි සබ්රි රහීම් මහතා සිදුකර ඇති නීති විරෝධී විෂමාචාර ක්‍රියාව පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමුකර ඇති හෙයින් එම මන්ත්‍රීවරයා කාරක සභා නියෝජනය නොකළ යුතු බවට යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම
- "පාස්කු ඉරුදින ප්‍රහාරය සහ ජාතික ආරක්ෂාව පිළිබඳ වර්තමාන තත්ත්වය" පිළිබඳව සභාව කල් තැබීමේ විවාදය තව දුරටත් පැවැත්වීම

# පාර්ලිමේන්තු විත්ති

**පුවත් හසුන I 39 වැනි කාණ්ඩය I සැප්තැම්බර් 2023**

**ISSN 2806 – 5425**

**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka